නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05
මාසික ධර්ම සංග්‍රහය අංකː167
ශ්‍රී. බු. ව. 2558 | 2014 මැයි 14 | වෙසක් කලාපය

# පංචසීලයේ ආනිසංස

අම්බලන්ගොඩ, කහව, ගල්දූව, ශ්‍රී ගුණවර්ධන යෝගශ්‍රමයේ
## අතිපූජ්‍ය රිදියගම සුධම්මාභිවංස හිමිපාණන් විසිනි

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

ශ්‍රද්ධාවන්ත පින්වතුනි, පින්වතියනි,

තුන්ලොව සනසාලන්නට ලොව පහළ වී වදාළා වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී මුඛ පාඨයකින් කොටසක් වූ ඉහත දහම් කරුණ පිළිබඳ මොහොතක් සිතන්න

නැණවත් සත්පුරුෂයෝ කිසිකලකත් තම ආත්මගරුත්වයට හානි වන ක්‍රියාවන් හි නොයෙදෙති. අනුශාසනා නොකරති. එසේනම් සම්මා සම්බුදු බව පතා පාරමී පුරන බෝධිසත්වයන් වහන්සේලා ගැන කවර කතාද? උන්වහන්සේලා තම ජීවිතය පවා නොතකා සීලයේ අනුසස් ලොවට හෙළිදරව් කල උතුම් බෝසත් චරිතයන් දක්වමින් තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ඉහත දහම් පාඨයෙන් අපට පවසනුයේ ලොව උසස් සේ සලකන සියල්ලටම වඩා සීලයම උතුම් බව නොවේද?(වැඩි විස්තර සඳහා සීලවීමංස ජාතකය බලන්න)

ඒ පංචසීලයේ පටන් සතර සංවර සීලය දක්වා පුළුල් වූ එම සීලයන් අතරින් පංචසීලයවත් හැකි පමණින් රැකගැනීමෙන් කොතරම් යහපතක් වනු ඇත්දැයි සිතන්න. ඒ සඳහා පින්වත් ඔබට අනුබල දෙනු වස් පංචසීල ආනිසංස තථාගතයන් වහන්සේගේ දේශනාවන්ට අනුකූලව මෙහිලා සඳහන් කරන්නෙමු. මේ කරුණු හොඳින් කියවා ආනිසංස දැන පන්සිල් රැක පාරමී පිවිත ආලෝකමත් කරගනිත්වා.

**පංචසීලය හා ආනිසංස**

1. පාණාතිපාතා වේරමණී - පරපණ නැසුමෙන් වැලකිම - ආනිසංස 23 ක් විශේෂයෙන් දැක්වේ.
2. අදින්නාදානා වේරමණී - සොරසිතින් ගැනුමෙන් වැලකිම - ආනිසංස 11 ක් විශේෂයෙන් දැක්වේ.
3. කාමේසු මිච්ඡාචාරා වේරමණී - වැරදි කම්සුවෙන් වැලකිම - ආනිසංස 19 ක් විශේෂයෙන් දැක්වේ.
4. මුසාවාදා වේරමණී - මුසා බස් බෙනුමෙන් වැලකිම - ආනිසංස 14 ක් විශේෂයෙන් දැක්වේ.
5. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී - සුරාපාණයෙන් වැලකිම - ආනිසංස 30 ක් විශේෂයෙන් දැක්වේ.

මෙසේ මූලික වශයෙන් ආනිසංස 97 ක් සඳහන් වන අතර මෙම ආනිසංසයන්ට අමතරව තවත් බොහෝ ආනිසංස ඇති බව අටුවාචාරීන් වහන්සේලා දක්වා ඇත.

**සත්ව ඝාතනයෙන් වැළකී සිටීමෙන් ආනිසංස 23 ක් ලැබේ**

01. ආරෝහ පරිනාහ සම්පත්තිතා - ආරෝහ පරිනාහ සම්පත්තියෙන් යුක්ත වීම
02. ජව සම්පත්තිතා - ජව සම්පත්තියෙන් යුක්ත වීම
03. සුප්පතිට්ඨිත පාදතා - මනාව පොළොවෙහි පිහිටන පියවර ඇත්තෙකු වීම
04. චාරුතා - රන්වන් පාට සිරුරක් ඇත්තෙකු වීම

05. මුදුතා - මෘදු, මොලොක් සිරුරක් ඇත්තෙකු වීම
06 සුචිතා - නිර්මල බව පිරිසිදු පැවතුම් ඇත්තෙකු වීම
07. සුරතා - සූර වීර ගති ඇත්තෙකු වීම
08. මහබ්බලතා - මහා බලවන්තයෙකු වීම
09. විස්සට්ඨ වචනතා - නොපැකිළ කිව හැකි වචන ඇත්තෙකු වීම
10. ලෝක පියතා - ලෝක සත්වයාට ප්‍රියමනාප පුද්ගලයෙකු වීම
11. නේලතා - පහකළ දොස් ඇත්තෙකු වීම
12. අහෙජ්ජ පරිසතා - කෙනෙකුට කේලම් කියා බිඳවිය නොහැකි පරිවාර සම්පත්තියක් ලැබීම
13. අච්ජම්භිත - තැති නොගත් කෙනෙකු වීම
14. අප්පධංසිතා - විනාශ නොකළ හැකි උතුමෙකු වීම
15. පරූපක්කමේන අමරණතා - පර උපක්‍රම වලින් අකල් මරණයට පත්නොවන බව
16. අනන්ත පරිවාරතා - අනන්ත වූ පරිවාර සම්පත් ඇති බව
17. සුරූපතා - සුරූපී පුද්ගලයෙකු වීම
18. සුසණ්ඨානතා - මනා සටහන් ඇත්තෙකු වීම
19. අප්පා බාධතා - අල්ප ආබාධ ඇත්තෙකු වීම
20. අසෝකිතා - ශෝක නොකරන්නෙකු වීම
21. පියෙහි මනාපේහි සද්ධිං අවිප්පයෝගතා - ප්‍රිය මනාප පුද්ගලයින්ගෙන් වෙන්වන්නට සිදු නොවන්නෙකු වීම
22. දීඝායුකතා - දීර්ඝායුෂ ලබන්නෙකු වීම
23. අඞ්ගපච්චඞ්ග සම්පන්නතා - මනාව පිහිටි අඟපසඟ ඇත්තෙකු වීම

**<u>සොරෙන් ගැනීමෙන් වැලකී සිටීමෙන් ආනිසංස 11 ක් ලැබේ.</u>**

01. මහද්ධනතා - මහා ධනවතෙකු වීම
02. පහූත ධන ධඤ්ඤතා - බොහෝ ධන ධාන්‍ය ලබන්නෙකු වීම
03. අනන්ත භෝගතා - අනන්ත භෝග සම්පත් අත්තෙකු වීම
04. අනුප්පන්න භෝග උප්පත්තිතා - නූපන් වස්තුව උපදවීමට පුණ්‍ය ශක්තිය ඇත්තෙකු වීම
05. උප්පන්න භෝග ථාවරතා - ඇත්තාවූ භෝග රැක ගැනීමේ වාසනාව
06. ඉච්ඡිතානං භෝගානං ඛිප්ප පටිලාභිතා - කැමති යම් වස්තුවක් වේද එය වහා ගන්නෙකු වීම.
07. රාජචෝරුදකග්ගි අප්පිය දායාදේහි ආසාධාරණ භෝගතා - රාජ සොර ගිනි ජල අප්‍රිය දරුවන්ට සාධාරණ නොවූ විනාශ කල නොහැකි වස්තුව ඇති වීම
08. අසාධාරණ ධන පටිලාභිතා - ආසාධාරණ ධන වාසනා ඇත්තෙකු වීම
09. ලෝකුත්තමතා - ලෝකයේ උත්තමයෙකු බවට පත්වීම
10. නත්ථික භාවස්ස අජානනතා - නැත යන වචනය අහන්නෙකුවත් නොවීම
11. සුඛ විහාරිතා - සැප විහරණ ඇත්තෙකු වීම

**<u>බ්‍රහ්ම චරියාව රැකීමෙන් ආනිසංස 19 ක් ලැබේ.</u>**

01. විගත පච්චත්ථිකතා - සතුරන් නැත්තෙකු වීම
02. සබ්බ ජන පියතා - සියළු ජනතාවම ප්‍රිය කරන්නෙකු වීම
03. අන්න පාන වත්ථ සයනාදීනං ලාභිතා - ආහාර පාන ඇඳුම් පැළඳුම් ඉඳුම් හිටුම් කිසිම අඩුපාඩුවක් නැතිව ලැබීමේ භාග්‍ය ඇත්තෙකු වීම
04. සුඛ සයනතා - සැපසේ නින්ද යාම
05. සුඛ පිටි බුජ්ඣනතා - සැපසේ පිබිදීම

06. අපාය භය විනිම්මුත්තතා - අපාය භිය නැත්තෙකු වීම
07. ඉත්ථි භාව පටිලාභස්සවා නපුංසකාභාව පටිලාභස්සවා අභබ්බතා - කාන්තාවක් වී හෝ පණ්ඩුක නපුසංක උභතෝ ඛ්‍යාඤ්ජනක ආදී අභව්‍ය තත්වයන්ට කිසි කලෙකෙත් පත් නොවීම
08. අක්කෝධනතා - ක්‍රෝදය අඩු පුද්ගලයෙක් වීම
09. පච්චක්ඛ කාරිතා - ඒ ඒ දෙය පරීක්ෂා කරන්නෙකු වීම
10. අසත්තක්ඛන්ධතා - කරනොබාගත් කෙනෙකු වීම
11. අනධෝමුඛතා - (සැක බිය නිසා ) බිම බලාගෙන නොසිටින්නෙකු වීම
12. ඉත්ථිපුරිසානං අඤ්ඤමඤ්ඤ පියතා - ඔවුනොවුන්ට ප්‍රිය මනාප අමුසැමියන් ලැබීම
13. පරිපුණ්ණ ඉන්ද්‍රියතා - පිරිපුන් ඉඳුරන් ඇති බව (අල්ප උත්සහ ඇත්තෙකු වීම)
14. පරිපුණ්ණ ලක්ඛණතා - පිරිපුන් ලක්ෂණ ඇති බව
15. නිරාසංකතා - සැක නැති පුද්ගලයෙක් වීම
16. අප්පොස්සුක්කතා - මහන්සි නොවී ධනය ලැබීමේ භාග්‍ය
17. සුඛ විහාරිතා - සැප විහරණ ඇත්තෙකු වීම
18. අකුතෝ භයතා - කුමක් නිසාවත් කිසිතැනක බිය නොවන්නෙකු වීම
19. පියවිප්පයෝගභාවතා - ප්‍රියයන්ගෙන් වෙන් නොවන්නෙකු වීම

## මුසාබස් නොබැනීමෙන් ආනිසංස 14 ක් ලැබේ.

01. විප්පසන්න ඉන්ද්‍රියතා - අතිශයින් ප්‍රසන්න ඉඳුරන් ඇත්තෙකු වීම
02. විස්සට්ඨ මධුර භාණිතා - මහා මිහිරි කටහඬක් ඇත්තෙකු වීම
03. සමසිත සුද්ධ දන්තතා - සමානව පිහිටි සුදෝ සුදුවන් දත්පෙලක් ඇත්තෙකු වීම
04. නාති ථූලතා - අසෝභන වූ මහත් ශරීර නොලබන්නෙකු වීම
05. නාති කිසතා - අශෝභන කෙට්ටු ශරීර නොලබන්නෙකු වීම
06. නාති රස්සතා - අශෝභන මිටි ශරීර නොලබන්නෙකු වීම
07. නාති දීඝතා - අශෝභන උස ශරීර නොලබන්නෙකු වීම
08. සුඛ සම්ඵස්සතා - සැප ස්පර්ශ ඇත්තෙකු වීම
09. උප්පල ගන්ධ මුඛතා - දුගඳක් නැති මහනෙල් මල් සුවඳ ඇති මුඛයක් ලැබීම
10. සුස්සූසක පරිජනතා - සුවච කීකරු පරිවාර ජනයා ඇති බව
11. ආදෙය්‍ය වචනතා - විශ්වාස කළ යුතු වචන ඇත්තෙකු වීම
12. කමලුප්පල සදිසි මුදුලෝහිතතනු පිච්ඡතා - නෙළුම්, මහනෙල් පෙත්තක් මෙන් මෘදු වූ රත්පැහැ දිවක් ලබන්නෙකු වීම
13. අනුද්ධතතා - උඩඟු නොවන බව
14. අචපලතා - චපල (අදහස් වැඩ ක්‍රියා) නැත්තෙකු වීම

## මත් පානයෙන් වැළකී සිටීමෙන් ආනිසංස 30 ක් ලැබේ.

01. අතීත අනාගත පච්චුප්පන්නේසු කිච්චකරණීයේසු ඛිප්පං පටිජානනතා - තුන්කල්හි කරන යම් කටයුත්තක් වේද එය වහා වැටහෙන බව.
02. සදා උපට්ඨිත සතිතා - සෑම කල්හිම එළඹ සිටි සිහි ඇත්තෙකු වීම
03. අනුමත්තකතා - උම්මත්තක නොවී ඉපදීම
04. ඤාණවන්තතා - ඤාණවන්තයෙකු වීම
05. අනලසතා - අලස නොවීම
06. අජළතා - (ජඩ නොවීම) නොහික්මුණු ක්‍රියා නොකිරීම
07. අනේල මුගතා - කෙළතොලු නොවීම

08. අමන්තතා - තරුණ මදයෙන් ආදී මත් වූ ස්වභාවයක් නැති බව
09. අප්පමත්තතා - අප්‍රමාද විහරණ ඇත්තෙකු වීම
10. අසම්මෝහතා - මෝහයෙන් මුලාවී කටයුතු කරන්නෙකු නොවීම.
11. අවිජම්භිතා - හැකි ගැනීම් නැත්තෙකු වීම .
12. අසාරම්භිතා - එකට එක නොකිරීම
13. අනිස්සුකිති - ඊර්ෂ්‍යා නොකරන බව
14. සච්ච වාදිතා - සත්‍ය වචන කථා කරන්නෙකු වීම
15. අපිසුනා පරුසා සම්පප්පලාපවාදිතා - කේලාම්, පරුෂ, හිස් වචන කතාකරන්නෙකු නොවීම
16. රත්තින්දිවමතන්දිතා - දිවා රෑ දෙකෙහි අලස බවින් තොරව කටයුතු කරන්නෙකු වීම
17. කතඤ්ඤුතා - කළ ගුණ දන්නෙකු වීම
18. කතවේදිතා - කළ උපකාරයට ප්‍රති උපකාර කරන්නෙකු වීම
19. අමච්ඡරිතා - මසුරු මල ධර්ම නැනැත්තෙකු වීම
20. චාග වන්තතා - ත්‍යාග වන්තයෙකු වීම
21. සිල වන්තතා - මහා සිල්වතෙකු වීම
22. උජුතා - ඍජු ගති පැවතුම් ඇත්තෙකු වීම
23. අක්කෝධනතා - ක්‍රෝධ නොකරන සත්පුරුෂයකු වීම
24. හිරිමනතා - පව් කිරීමට ලැජ්ජා ඇති ගුණවත් අයෙකු වීම.
25. ඔත්තප්පිතා - පව් කිරීමට බිය ඇත්තෙකු වීම
26. උජුදිට්ඨිකතා - ඍජු අදහස් ඇත්තෙකු වීම
27. මහා පඤ්ඤතා - මහා ප්‍රඥාවන්තයෙකු වීම
28. මේධාවිතා - මහා චින්තන ශක්තියක් ඇත්තෙකු වීම
29. පණ්ඩිතතා - දාර්ශනික අදහස් ඇති පණ්ඩිතයෙකු වීම
30. අත්ථානත්ථ කුසලතා - අර්ථය, අනර්ථය, වැටහෙන හසල බුද්ධියක් ඇති බව

( පරමත්ථ ජෝතිකා නම් ඛුද්දක පාඨ අට්ඨ කථාව ඇසුරිනි)

මෙසේ ලුහුඩින් දැක්වූයේ පන්සිල් රැකීමේ ආනිසංසයෝය.

**තුන්ලොවට පිහිට වන්නට ලොව පහළ වී වදාළ ශාන්තිනායක බුදුරජාණන් වහන්සේගේ අනන්ත අපරිමාන බුදුගුණ බලයෙන් මෙම උතුම් දහම් කරුණු පින්වතුන්ට මෙලොව පරලොව සැප පිණිසම වේවා! වෙනස් නොවන එකම සැපත වූ, පරම සැපත වූ, ස්ථිර සැපත වූ ශාන්ත සුන්දර අමා මහ නිවන් සුව පිණිසම වේවා. සම්බුදු සසුනෙහි චිර පැවැත්ම පිණිස වේවා**

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**